# සුදු මහත්තයාගේ ඇස්



W.A. සතිනි යෙතුම්සා වීරසිංහ

# “සුදු මහත්තයාගේ ඇස්”


**කතෘ ප්‍රකාශනයකි**

දෙවන E- පොත දිගහැරුම 2023 දෙසැම්බර්



**කතාව සහ චිත්‍ර**

W.A. සතිනි යෙතුම්සා වීරසිංහ
4 ශ්‍රේණිය



**ISBN අංකය**

978-624-206-921-0


**කතෘගේ වෙනත් කෘතීන්**

ඉවී සහ එලා (ISBN අංකය 978-624-96932-1-0)

ආදර අම්මා සහ අප්පච්චී (ISBN අංකය 978-624-96932-0-3)

The Shapes (ISBN අංකය 978-624-96932-2-7)

වැරදුණු උගුල (ISBN අංකය 978-624-206-653-0)

# පිදුම

මහාමායා පන්හිඳෙන්

"දිවිය දිනන විද්‍යුත් පොතක්"

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව

අප පාසල විසින් සංවිධානය කළ

"දිවිය දිනන විද්‍යුත් පොතක්"

ව්‍යාපෘතියට සමගාමී ව

මා විසින් රචනා කරන ලද

මෙම ග්‍රන්ථය මාගේ සෙවණැල්ල මෙන්

ළඟ සිටින ආදරණීය අම්මාට හා අප්ච්චීට

මෙය පිදුමක් ම වේවා !

එමෙන් ම ගුරු විදුහල්පතිතුමිය ඇතුළු

මෙම ව්‍යාපෘතියේදී සහයෝගය දුන් ගුරු මණ්ඩලයට ද
මෙම සංකල්පය අප වෙත ළඟා කරදුන්

සෙනෙවිරත්න ගුරු පියාණන්ට ද

පිදුමක් වේවා!

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තයික් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර


2023.11.01

# සුදු මහත්තයාගේ ඇස්

ඔන්න සුදු මහත්තයෙක් ඉගිලෙන ලොකුම ලොකු කුරුල්ලෙක් උඩ නැගලා ඈත මුහුදෙ ඉඳලා ආවලු රත්තරන් පාට පස් තියන පොළොවකට.



ඒ බිමේ කොළ පාට ගස් පිරිලා තිබුණා. ඕනෙ එළවළුවක් වගා කරන්නත් පුළුවන්. පලතුරු සරුවට වැවෙනවා. ආහාරෙන් කිසි අඩුවක් නෑ.



සුදු මහත්තයා කැලේ පැත්තට ඇවිදන් ගියා. ගාම්භීර පෙනුමක් ඇති කේසර සිංහයෙක් එයා දැක්කා. ඒ විතරක් ද ලස්සන දළ තියෙන ඇතෙක් ද ඒ අසළින් ගියා. පිල් විහි දූ මොනරෙක් ගහක වහලා හිටියා. මේ කැලේ අස්සෙන් ලස්සන දිය ඇල්ලක් ද ගලා බැස්සා. සුදු මහත්තයාගේ ඇස් ආසාවෙන් පිරුණා.



තවත් ඇවිදන් යන කොට සුදු මහත්තයාට උස කන්දක් පෙනුණා. මිනිස්සු සුදු ඇඳුමින් සැරසී ඒ කන්ද පැත්තට යනවා. සමනල්ලු ද පියාඹනවා. සුදු මහත්තයා ඒ කන්ද පැත්තට ඇදුණා. මේ යනගමනේ දී සීත දිය පාරවල්, කුඩා කඩ, කවි කියන මිනිස්සු එයා දැක්කා. ඒ මිනිස්සු සුදු මහත්තයාට කන්න කෑමත් දුන්නා. ඒ කන්ද මුදුණේ ලොකු බෙල් එකක් හයි කරලා තිබ්බා. කන්ද උඩට නගින මිනිස්සු ඒ බෙල් එක නාද කෙරුවා. මිනිස්සු හැමෝම කන්ද උඩ ඇති පූජනීය ස්ථානයකට ගෞරවයෙන් වැන්දා. කන්ද මුදුණට ඉර පායනවා ලස්සනට පේනවා. සුදු මහත්තයා ඒ දිහා ආසාවෙන් බලා හිටියා.



අවට සිරි නරඹපු සුදු මහත්තයා හෙමින් පහළට බැස්සා. ඉවරයක් නැහැ. තවත් ලස්සනට පේන කොළ පාට කඳු වළල්ලක් තිබ්බා. ඒ කඳු නගිමින්, හිසේ රෙදි බැඳගත් කාන්තාවෝ පිරිසක් කොළ පාට දළු නෙළමින් ඒවා පිටේ බැඳගත් කූඩයකට දැම්මා. සුදු මහත්තයා ඉන් කොළයක් අරගෙන සුවඳ බැලුවා. පුදුමයි! ඒවායින් නැවුම් සුවඳක් ආවා. සුදු මහත්තයාගේ කටට කෙළත් ආවා. කඳු අතරින් ලස්සනට කෝච්චියක් ඇදුණා.



ඒ කෝච්චියේ නැගගත් සුදු මහත්තයාට රසවත් තේ කෝප්පයක් ද බොන්නට ලැබුණා. ඔහු සුව නින්දකට ගියා. ඇස් ඇහැරී බලන විට ඉඳුනිල් පැහැ මුහුදක සුදු පාට රැළි නගිනවා සුදු මහත්තයා දැක්කා. මද වේලාවකට පස්සේ රත්තරන් පාටින් අහසේ ඉදන් ඉර මුහුද ඇතුළට ගිලුණා. බිලී පිති කරේ දමාගත් ධීවරයින් පිරිසක් මාළු බාන්නට ගියා.



පසු දින සුදු මහත්තයා වෙරළේ ඇවිදින්නට ගියා. කුඩා නිවසක හිය ගන්වනසුළු හා වර්ණවත් ලෙස සාදන ලද වෙස් මුහුණු කිහිපයක් එයා දැක්කා. මේවායේ පාට හරි අපූරුයි!. මිනිස්සු ගොඩක් ඉවසීමෙන්, වෙහෙස මහන්සී වී මේවා හදනවා. සුදු මහත්තයා ඉන් කිහිපයක් මිල දී ගත්තේ හිතේ ලොකු සතුටකින්.



“හිස් පළඳනා දා ගත් මිනිස්සු, නළලේ තිලක තැබූ ගැහැනුන්, මන් වගේ අය එතන හිටියා. “ලස්සන භාෂාවක් කතා කරන මිනිස්සු නේද මෙහෙ ඉන්නේ?” සුදු මහත්තයා කෙනෙකුගෙන් ඇහුවා.

“ඔව් අපි සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් අය. අපේ හිතුත් ලස්සනයි මහත්තයෝ” එයාලා කිව්වා.



“ඔයාල කොහෙද යන්නේ? ” සුදු මහත්තයා ඇහුවා. “අපි දළදා වඳින්න යනවා.” “ මාත් එන්නද?” කියා සුදු මහත්තයා ඇහුවා. “හොඳයි ” ලෙස පිළිතුරු ලැබුණා. සුදු මහත්තයා ආසාවෙන් තිරික්කලයකට නැග්ගා. රාත්‍රිය වන විට ලස්සන වැවක් ළඟ පිහිටි මාලිගාවක් ළඟට සුදු මහත්තයා ආවා. අලි ඇතුන් අපූරුවට සරසලා තිබුණා. නැට්ටුවෝ, ගිනි බෝලකරුවෝ, බෙර ගසන්නෝ, නළා කරුවෝ පෙළ ගැහිලා හිටියා. වර්ණවත් පෙරහැරක් ආවා. සුදු මහත්තයාගේ ඇස් පුදුමයෙන් පුදුමයට පත් වුණා. “හරිම අපූරු පෙරහැරක්නේ මේක.” එයා කිව්වා.



ඒ පෙරහැර යන සද්දේ මගේ ඉස්කෝලෙටත් ඇහෙනවා. ඒ වැවේ සීතල හුළං මගේ ඉස්කෝලෙට ඇවිත් අපිව වෙළා ගන්නවා. ඒ ලස්සන උතුම් නුවර තමයි මම ඉන්නේ. මේ උතුම් නුවර මහනුවරයි. මේ උතුම් රට ශ්‍රී ලංකාවයි. පෙරහැර බලමින් සිටි මම සුදු මහත්තයාට පැහැදිලි කළා.



-නිමි-



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.11.01